සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## කතෝලික ධර්මය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I - කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) ශු.සභා සම්ප්‍රදායට අනුව ශු.ලූක්තුමා කෘතිය සඳහා කරුණු දැනගත්තේ,
1. අපෝස්තුළුවරුන්ගෙනි.
2. ශු.පේදුරුතුමාගෙනි.
3. මරියතුමියගෙනි.
4. උපස්ථායකයින්ගෙනි.

02) දෙවියන් වහන්සේගේ ගැලවීම බලාපොරොත්තුවෙන් සිටි දැහැමි බැතිමතා වන්නේ,
1. සිමියොන් දිවැසිවරයාය.
2. ස්නාවක ජෙයහාන්ය.
3. යෙසායා දිවැසිවරය.
4. අනනියස් ය.

03) "ස්වාමීනි,මා සන්තක දෙයින් දෙකෙන් කොටසක් දිළිඳුන්ට දෙමි" මෙසේ පවසන්නේ කවුරුන්ද?
1. සීමොන් ය.
2. ශු.පාවුලුතුමාය.
3. ශු.පේදුරුතුමාය.
4. සකේවුස්ය.

04) ධනයට ලොල්වීමට එරෙහිව ජේසුස් වහනසේ දේශනා කළ උපමාව වන්නේ,
1. ධනපතියා හා ලාසරස් පිළිබඳ උපමාවය.
2. පොහොසත් මෝඩයා පිළිබඳ උපමාවය.
3. අධර්මිශ්ඨ විනිශ්චකාරයා පිළිබඳ උපමාවය.
4. යහපත් සමරිතානුවරයා පිළිබඳ උපමාවය.

05) පාළුකරයේ යාච්ඤාවේ හා මර්දන ක්‍රියාවල නිරතවෙමින් දුෂ්කර ජීවිතයක් ගත කළේ,
1. එලීෂා දිවැසිවරයා ය.
2. ස්නාවක ජොහාන්තුමාය.
3. යෙතයා දිවැසිවරයා ය.
4. මෝසෙස් තුමාය.

06) හෙරෝද් විසින් ස්නාවක ජොහාන්තුමා මැරීමට අදහස් කළ නමුත් එයට බිය වූයේ ඇයි?
1. ජනතාව ඔහුව දිවැසිවරයෙකු ලෙස සැලකූ නිසා.
2. එතුමා ප්‍රාතිහාර්ය කළ නිසා.
3. ජනතාව ඔහුව විමුක්තිදායකයෙකු ලෙස සැලකූ නිසා.
4. ජනතාව ඔහුට ලෙන්ගතු නිසා.

07) කිතුනුවන්ගේ ජීවිතයේ කේන්ද්‍රීය අභිරහස වනුයේ,
1. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය.
2. දිව්‍ය පූජා යාගය ය.
3. ශු.ත්‍රිත්වය ය.
4. දේව ප්‍රසාද නිධාන ය.

08) නපුර ප්‍රතික්ෂ්ප කර,විශ්වාසයේ ප්‍රබල සාක්ෂිකරුවන් වීමට කිතුනු කැඳවීම ලැබෙනුයේ,
1. පූජාත්වරයෙකි.
2. දිව්‍ය සත්ප්‍රසාදයෙනි.
3. අභිවෘද්ධි ආලේපයෙනි.
4. ප්‍රසාද ස්නාපනයෙන්.

09) ස්වර්ග රාජ්‍ය කරා ගමන් කිරීමේ දී මුහුණ දෙන අනතුරුවලින් වැළකීමට නම් අප සතුව තිබිය යුතු ශුද්ධාත්ම දීමනාව වන්නේ,

1. දැනගැන්මය.
2. ධෛර්ය ය.
3. ප්‍රඥාව ය.
4. දේව භක්තිය.

10) ප්‍රසාද ස්නාපනය හා අභිවෘද්ධ ආලේපය සඳහා තිබෙන පිළිවෙත් දෙක කුමන කාලයේ සිට පැවත එන්නක්ද?

1. ආදි පීතෘවරුන්ගේ කාලයේ සිටය.
2. ජන නායක මෝසෙසගේ කාලයේ සිටය.
3. ආපෝස්තුළුවරුන්ගේ කාලයේ සිට ය.
4. දිවැසිවරුන්ගේ කාලයේ සිටය.

- **අංක 11 සිට 15 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් සුදුසු පදය තෝරා හිස්තැන් පුරවන්න.**

11) ඉශ්‍රායෙල් ජනතාව නුමුහුන් පූප අනුභව කරමින් කුසලානෙන් පානය කළේ ......................................... පැවැත්වීමේදී ය.

12) දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට ආත්මික සූදානමේ අවශ්‍යතාව .................................. පෙන්වා දෙයි.

13) ප්‍රසාද ස්නාපනයේ දී ජනිත වූ විශ්වාසය පරිණත කරනු ලබන්නේ ................................... නි.

14) පාස්කු ඉරුදින ජේසුස් වහන්සේ ................................... වෙත හුස්ම හෙළා ශුද්ධාත්මයාණන් එවා වදාළ සේක.

15) අභිවෘද්ධි ආලේපය ලැබීමට නම් .......................................... ලබා තිබීම අනිවාර්ය වේ.

(නිසි ධර්මෝපදේශය, අපෝස්තුළුවරුන්, පාස්කු භෝජනය, අභිවෘද්ධි ආලේපය, ශු.පාවුලු තුමා)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදිනම් ( ✓ ) ලකුණ ද වැරදිනම් ( × ) ලකුණ ද යොදන්න.**

16) ශු.ත්‍රිත්වයේ අභිරහස වටහා ගැනීමට ශු.අගුස්තීනුතුමා මුහුදු වෙරළක ඇවිදිමින් සිටියේ ය. ( )

17) ඉශ්‍රායෙල් ජනතාව බැබිලෝනියාවේ වහලුන් වූයේ මිත්‍යා ඇදහිලි අනුගමනය කළ නිසාය. ( )

18) විශ්වාසයට විරුද්ධව නිරන්තරයෙන් පැන නගින පරීක්ෂාවක් වන්නේ මුදල්ය. ( )

19) ප්‍රතිමාවල පරමාර්ථය වන්නේ එම පුද්ගලයා සිහිපත් කිරිමය. ( )

20) ප්‍රතිවෘදින් යනුවෙන් අදහස් කරනුයේ ශුද්ධවන්තයෝ ය. ( )

(ලකුණු : 2 x 20 = 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01) i. ශු.ලූක් සුබාරංචියේ සඳහන් කාන්තා චරිත දෙකක් ලියන්න.
ii. ස්නාවක ජොහාන්තුමා පාළුකරයේ දුෂ්කර ජීවිතයක් ගත කළ ආකාර දෙක ලියන්න.
iii. ශු.ලූක් සුබාරංචියේ පණිවිඩ දෙකක් ලියන්න.
iv. ජේසුස් වහන්සේගේ ගලීල සේවාව තුළ දක්නට ලැබෙන සුවිශේෂී තොරතුරු දෙකක් ලියන්න.
v. ශුද්ධාත් ඵල දෙකක් ලියන්න.
vi. "ශුද්ධාත්මයාණන් වහන්සේ" යන යෙදුමට පුරාණ ගිවිසුමෙහි භාවිත කර ඇති යෙදුම් දෙකක් ලියන්න.
vii. "ලිටුර්ජියා" යන ග්‍රීක් වචනය සෑදී ඇති යෙදුම් දෙක මොනවාද?
viii. දිව්‍ය පූජාවේ ප්‍රධාන කොටස් දෙක මොනවාද?
ix. දිනපතාම යාම යැදුම සිදුකරමින් දෙවියන් වහන්සේට ප්‍රශංසා කරන පුද්ගල පාර්ශව දෙක කවුරුන්ද?
x. දේව දරුවෙකු ලෙස පාසලේදී ඔබට කළ හැකි කාර්යයන් දෙකක් ලියන්න. (ලකුණු : 2x10 = 20)

02) i. එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම සඳහා ඔබට කළ හැකි දේවල් 2 ක් ලියන්න.
ii. කතෝලික විශ්වාසයට අනුව මිථ්‍යා ඇදහිලි තුනක් ලියන්න.
iii. ශුද්ධවන්තයින්ගේ ආදර්ශය අනුව ඔබට කළ හැකි දේවල් 05 ක් ලියා දක්වන්න. (ලකුණු : 2+3+5 =10)

03) i. තුන්වන දේව පනතට අනුව සබත් දිනය වැදගත් වන හේතු දෙකක් ලියන්න.
ii. ඉරුදින දිව්‍ය පූජාවට අනිවාර්යයෙන් සහභාගි වීමෙන් නිදහස් විය හැකි සාධාරණ හේතු තුනක් ලියන්න.
iii. ඉරුදින ශුද්ධවත් ලෙස ගත කිරීම සඳහා ඔබට කළ හැකි කාර්යයන් පහක් ලියා දක්වන්න.
(ලකුණු : 2+3+5 =10)

04) i. ශු. සභාවේ නිල යැදුම හෙවත් යාම යැදුම යනු කුමක්ද?
ii. දේව වන්දනාවේ ප්‍රධාන අංග 3 මොනවාද?
iii. මුළු ජීවිතයම ජනවන්දනාවක් කරගනිමින් අන් අය වෙනුවෙන් කළ හැකි දයා සේවාවන් 5 ක් ලියන්න.
(ලකුණු : 2+3+5 =10)

05) i. අභිවෘද්ධි ආලේපය තුළින් ඔබට ලැබෙන ශුද්ධාත්ම දීමනා දෙකක් ලියන්න.
ii. අභිවෘද්ධි ආලේපය ලැබීමට අවශ්‍ය සුදුසුකම් තුනක් ලියන්න.
iii. අභිවෘද්ධී ආලේපය ලැබූවන්ට ලැබෙන දීමනා 5 ක් ලියන්න. (ලකුණු : 2+3+5 =10)

06) i. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීමට සූදානම් වන ආකාර දෙක ලියන්න.
ii. දිව්‍ය සත්ප්‍රසාද ලක්ෂණ තුනක් ලියන්න.
iii. දිව්‍ය සත්ප්‍රසාද භක්තියෙන් යුතුව ලබාගැනීමට ඔබට කළහැකි දේවල් පහක් ලියා දක්වන්න.
(ලකුණු : 2+3+5 =10)

07) i. ජේසුස් වහන්සේගේ දූත කාර්යයේ අරමුණට අනුව සුබසෙත අත්වන පුද්ගල කණ්ඩායම් දෙකක් ලියන්න.
ii. දේව රාජ්‍ය යනු කුමක්දැයි කරුණු තුනකින් ලියන්න.
iii. ජේසුස් වහන්සේගේ දූත සේවාව තුළින් ඔබට ගත හැකි ආදර්ශ 05 ක් ලියන්න.
(ලකුණු : 2+3+5 =10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## කතෝලික ධර්මය – පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

### I - කොටස

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 6 - 1 | 11 - පාස්කු භෝජනය. | 16 - (✓) |
| 2 - 1 | 7 - 2 | 12 - ශු.පාවුලුතුමා | 17 - (✓) |
| 3 - 4 | 8 - 4 | 13 - අභිවෘද්ධි ආලේපයෙනි. | 18 - (✓) |
| 4 - 2 | 9 - 1 | 14 - අපෝස්තුළුවරුන්. | 19 - (✓) |
| 5 - 2 | 10 - 3 | 15 - නිසි ධර්මෝපදේශය | 20 - (x) |

(ල 2 x 20 = 40)

### II - කොටස

01) i. මරියතුමිය / එලිසබෙත් තුමිය / අන්නා දිවැසිවරිය / නායින් නුවර වැන්දඹුව / පවුකාර ස්ත්‍රිය / මාර්තා හා - මරියා / කුදු ස්ත්‍රිය / ජෙරුසෙලම් ස්ත්‍රීන්. (පිටුව 9)

ii. යාච්ඤාවෙන්.
දැඩි මර්දන ක්‍රියාවල නිරතවෙමින්.

iii. ප්‍රීතිය හා තුති පැසසුම්.
තමන් සතු දෙය වගකීමෙන් යුක්තව පරිහරණය කිරීම.
ආගමික වත් පිළිවෙත්.

iv. උන්වහන්සේගේ ඉගැන්වීම.
සුව කිරීම් සම්බන්ධ තොරතුරු.

v. ස්නේහය / ප්‍රීතිය / සමාදානය / ඉවසීම / කරුණාව / යහපත්කම / නොබිදෙන දිරිය / සාන්තදාන්තකම / විශ්වාසවන්තකම / මර්යදාව / වෘතභාවය / පිරිසිදුකම.

vi. ආත්මානුභාවය.
දේවාත්මානුභාවය.
ශුද්ධාත්මය.

vii. ලාඕස්. එර්ගොන්.

viii. දේව වාක්‍ය පිළිවෙත.
ස්තෝත්‍ර යාගික පිළිවෙත.

ix. පූජක පිරිස.
පැවිදි පිරිස.

x. සිසුවා ලියා ඇති ආකාරයට ලකුණු ලබා දෙන්න. (ල 2 x 10 = 20)

02) i. එකම දෙවියන් වහන්සේට පමණක් වන්දනා කිරීම.
ඒක දේව වන්දනාවෙන් දේව සබඳතා වර්ධනය කර ගැනීම.
මිථ්‍යා ඇදහිලිවලින් වැළකී අන් අයද ඉන් බේරා ගැනීම.
යක්‍ෂ, භූත මායම් ඇති බව විශ්වාස නොකිරීම. (පිටුව 74 )

ii. නැකත් බැලීම / බලිතොවිල් / ලග්න පලාඵල / යන්ත්‍ර මන්ත්‍ර / ශාස්ත්‍ර ඇසීම / ගුරුකම් / පේන බැලීම / හූනියම් / දෙහි කැපීම.

iii. ජීවිතයේ සෑම කටයුත්තකදීම දෙවියන් වහන්සේට මුල්තැන දීම.
දේව වචනයට මුල්තැන දෙමින් දිනපතා ශු.බයිබලය කියවා මෙනෙහි කිරීම.
අන් අයට උදව් වීම හා ඒ සඳහා කැපවීමට නොපසුබට වීම.
සාන්තුවර චරිත කතා කියවමින් ඒවා තම ජීවිතයට ආදර්ශයක් කර ගැනීම.
සාන්තුවරුන් ජීවත් වූ ආකාරයට අනුව ජීවත් වීම. (ලකුණු : 2+3+5 =10)

03) i. ජේසුස් වහන්සේගේ උත්ථාන වූ දිනය.
උත්ථාන වූ ජේසුස් වහන්සේ වැඩිපුරම දර්ශනය වූ දිනය.
ශුධාත්මාගමනය සිදු වූ පෙන්තකොස්ත දිනය.

ii. අසාධ්‍ය ලෙස ගිලන්ව එක්තැන් වී සිටීම.
රෝගියෙකු බලා ගැනීම.
දිව්‍ය පූජා යාගයක් සිදු කිරීමට පූජකයෙක් නොමැති වීම.

iii. දිව්‍ය පූජා යාගයට අර්ථාන්විත සහභාගී වීම.
දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම.
එදිනට නියමිත දේව වාක්‍ය කොටස් කියවා මෙනෙහි කිරීම.
දහම් පාසලට සහභාගී වීම.
හැකිතාක් දයාවේ ක්‍රියාවන්හි නිරත වීම. (පිටුව 83) (ලකුණු : 2+3+5 =10)

04) i. දවසේ නිශ්චිත කාලවලදී ගීතාවලියේ ගීතිකා හා ශු.බයිබලීය ගීතිකා ඇසුරින් දේව ජනතාව එක් වී දෙවියන් වහන්සේට සිදුකරන ප්‍රශංසාත්මක යාච්ඤා පිළිවෙතක් වේ.

ii. දිව්‍ය පූජාව.
ප්‍රසාද නිධාන.
යාම යැදුම.

iii. පාසලේ හා මීසමේ සමිති සමාගම්වලට බැඳී අසරණවූවන්ට සරණය වීම.
අන් අයගේ දුක්වේදනා හමුවේ සංවේදී වී පිහිට වීම.
මගේ සැපතේදී පමණක් නොව අන්අයගේ සැපතේදී ද සතුටු වීම.
පාසලේ අසරණ වූ හා කොන් වූ සැමට කාරුණාව දැක්වීම.
මා සතු දේ අන් අය හා බෙදා ගැනීම.
ජනවන්දනා කටයුතු සංවිධානයේ දී සහය වීම.

(ලකුණු : 2+3+5 = 10)

05) i. ප්‍රඥාව / තේරුම් ගැනීම / දැනුමැතිකම / ධෛර්යය / දැනගැන්ම / දේව භක්තිය / දේව භය.

ii. ප්‍රසාද ස්නාපනය ලබා ගැනීම.
වයස අවුරුදු 14 සම්පූර්ණ කර තිබීම.
ඉෂ්ට වරප්‍රසාදය ඇතිව සිටිම.
නිසි ධර්මෝපදේශයක් ලබා සූදානම් වීම.
ප්‍රසාද නිධානය ලබා ගැනීමට අශාව හා උනන්දුව.

iii. දෙවියන් වහන්සේට "අබ්බා පියාණනි"යනුවෙන් ඇමතිමට හැකි වීම.
ක්‍රිස්තුන් වහනසේට වඩාත් ගැඹුරින් සම්බන්ධ වීමට හැකි වීම.
ශුද්ධාත්ම දීමනා වර්ධනය වීම.
ශු.සභාවේ පූර්ණ සහභාගීත්වය ලැබීම.
ක්‍රිස්තුන් වහන්සේගේ සැබෑ සාක්ෂිකරුවෙකු ලෙස වචනයෙන්, ක්‍රියාවෙන් විශ්වාසය ප්‍රචලිත කිරීම.
ආත්මය තුළ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් කිරීම

06) i. ආත්මික සූදානම.
ශාරීරික සූදානම.

ii. දේව ප්‍රසාද නිධානයකි. ගිවිසුමකි.
භෝජනයකි. ස්තුති කිරීමකි.
යාගයකි. සිහි කිරීමකි.

iii. (සිසුවා ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න.)

(ලකුණු : 2+3+5 = 10)

07) i. දිළිඳුන් / වහලුන් / පීඩිතයින් / අන්ධයින්

ii. දෙවියන් වහන්සේගේ පාලනයට නතුවීම.
පාපය ඉවතලා දේව වරප්‍රසාදය තුළ ජීවත් වීමයි.
දේව අභිමතයට මිනිස් සමාජය නතු වීමයි.
ප්‍රේමය, සත්‍යය, යුක්තිය, සාධාරණත්වය හා ගුණධර්ම අනුව ජීවත් වීමයි.

iii. සැබෑ වූ එකම දෙවියන් වහන්සේ තුළ පමණක් ජීවත් වීම.
අභියෝග / යක්ෂ පරීක්ෂා හමුවේ නොසැලී ඒවාට මුහුණ දෙමින් ජය ගැනීම.
නිරන්තරයෙන් යාච්ඤා කිරීම හා සිය සේවාවන්ට පෙර පිහිට අයැදීම.
ජාති, කුලභේදයෙන් තොරව ධර්මය දේශනා කරමින් සුබාරංචිය ප්‍රකාශ කිරීම.
අසරණයන්ට පිහිට වෙමින් දයාවේ සේවාවන් වල නිරත වීම.

(ලකුණු : 2+3+5 = 10)

(8) WWW.PastPapers.WiKi (7)
Download Term Test Papers, Short Notes From One Place!

PAST PAPERS WIKI
(8) WWW.PastPapers.WiKi (8)
Download Term Test Papers, Short Notes From One Place!

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**